ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි

ඩුබායි දහම් පාසල

2019 - 2020 ළමා චිත්‍ර කුසලතා අගැයීම - නීති මාලාව

1. මෙම චිත්‍ර කුසලතා අගැයීමට ඩුබායි දහම් පාසලේ දැනට අධ්‍යාපනය ලබන හෝ කලින් දහම් පාසලේ අධ්‍යාපනය ලබා 8 වසර සම්පූර්ණ කර වයස අවුරුදු 16 ට අඩු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණක් සහභාගී විය හැක.

2. තරඟය, අමුණා ඇති පත්‍රයේ සඳහන් වයස් කණ්ඩායම් අනුව පැවැත්වෙනු ඇත.

3. වයස් කණ්ඩායමට අදාළ නොවන මාතෘකා තෝරාගැනීම කුසලතා අගැයීමෙන් ඉවත්කිරීමට හේතු වනු ඇත. මාතෘකා පසුව දැනුම් දෙනු ඇත.

4. පසුගිය අගැයීම් වල ජයග්‍රහණය කරන ලද චිත්‍ර ඇඳීමෙන් වලකින්න.

5. කාලය:

   වයස් කණ්ඩායම් 6-8, 8-10, 10-12: පැය 2 විනාඩි 30
   
   වයස් කණ්ඩායම් 12-14, 14-16 : පැය 3

6. හොඳම චිත්‍ර, සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය මඟින් පත් කර ගන්නා ලද විනිශ්චය මණ්ඩලයක් විසින් තෝරාගනු ඇත. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන අතර ඒ සම්බන්ධයෙන් කිසිම සාකච්ඡාවකට සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය ඉදිරිපත් නොවනු ඇත.

7. කුසලතා අගැයීමට සහභාගී වන සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම A3 ප්‍රමාණයේ සුදු කඩදාසියක් සපයන අතර අනෙකුත් අවශ්‍ය ද්‍රව්‍යය; පාට පැන්සල්, දියසායම්, පැස්ටල් පැන්සල් ආදිය තරඟකරුවන් විසින් රැගෙන ආ යුතුය. Glitter, Platignum, Markers, Felt Pens, Calligraphy Pens, Gel Pens ආදිය පාවිච්චි කල නොහැක.

8. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය,

   2019 ඔක්තෝබර් 18 සිකුරාදා සවස 6. 00ට පෙර ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ පිහිටි ඩුබායි දහම් පාසල වෙත ලැබෙන්නට සලස්වන්න. මෙම දිනය සහ වේලාවට පසුව ලැබෙන අයදුම් පත්‍ර භාර නොගන්නා බව සලකන්න.

   **email මඟින් එවන අයදුම් පත්‍රද භාර නොගන්නා බව සලකන්න.**

9. අගැයීම පැවැත්වෙන දිනය: 2019 නොවැම්බර් 02 වැනිදා, සෙනසුරාදා. (තරඟ වේලාවන් සහ මාතෘකාවන් පසුව දැනුම් දෙනු ලැබේ.)

10. අගැයීම පැවැත්වෙන ස්ථානය: ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ පිහිටි ඩුබායි දහම් පාසල.

විස්තර සඳහා අමතන්න: මේනු : 055 3257190 චාන්දනී: 055 1177136